දුරකථන
தொலைபேசி
Telephones
011-2136600
011-2136650

ලේකම්
செயலாளர்
Secretary
011-2136602

ෆැක්ස්
தொலைநகல்
Fax
011-2876169
011-2876181

විද්‍යුත් තැපැල
மின் - அஞ்சல்
E-mail
info@psc.gov.lk

වෙබ් අඩවිය
இணையத்தளம்
Website
www.psc.gov.lk

# රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
# அரசாங்க சேவை ஆணைக்குழு அலுவலகம்
# OFFICE OF THE PUBLIC SERVICE COMMISSION

අංක 1200/9, රජමල්වත්ත පාර, බත්තරමුල්ල
இல. 1200/9, இராஜமல்வத்தை வீதி, பத்தரமுல்லை.
No. 1200/9, Rajamalwatta Road, Battaramulla

මගේ අංකය / எனது இல. / My No.: PSC/EST/05-01-02/01/2019

ඔබේ අංකය / உமது இல. / Your No.: MF1/02/20/EXC/3

දිනය / திகதி / Date: 2019.08.07

09 AUG 2019

ලේකම්
මුදල් අමාත්‍යාංශය

**<u>ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ පොලිස් හා අනෙකුත් නියාමන සේවා ගණය සඳහා වන බඳවා ගැනීමේ පටිපාටිය අනුමැතියට යොමු කිරීම</u>**

උක්ත කරුණ හා සම්බන්ධයෙන් ඔබේ සමාංක හා 2019.07.25 දිනැති ලිපිය හා බැඳේ.

02. ඒ අනුව, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද, එම කොමිෂන් සභාවේ ලේකම්ගේ අත්සනින් යුත් උක්ත බඳවා ගැනීමේ පටිපාටියේ මුල් පිටපත මේ සමඟ එවමි.

03. මේ පිළිබඳව අදාළ නිලධාරීන් දැනුවත් කරන ලෙසත්, අදාළ බඳවා ගැනීමේ පටිපාටිය ඔබ අමාත්‍යාංශයේ වෙබ් අඩවියේ පළකරන ලෙසත්, අනතුරුව ඒ බව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත වාර්තා කරන ලෙසත් කාරුණිකව දන්වමි.

ආර්.ඩී.පී.එස්.ධර්මසේන
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ
ලේකම් වෙනුවට

පිටපත්-
01. ලේකම් - ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව - (මුල් පිටපත මේ සමඟ එවමි)
02. සුරාබදු කොමසාරිස් ජනරාල් - (මුල් පිටපත මේ සමඟ එවමි)
03. ආයතන අධ්‍යක්ෂ ජනරාල් - (මුල් පිටපත මේ සමඟ එවමි)

## ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ නියාමන සේවා ගණයේ සුරාබදු නියාමක රියදුරු තනතුර සඳහා වන බඳවා ගැනීමේ පටිපාටිය

01. සම්බන්ධ වන ආයතන

1.1 දෙපාර්තමේන්තුව : සුරාබදු — යොමු අංකය : ED/2/14/3/1
දිනය: 2018.05.25

1.2 අමාත්‍යාංශය : මුදල් — යොමු අංකය : MF1/2/EXC/75
දිනය: 2018.06.26

1.3 කළමණාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත කිරීම : — යොමු අංකය : DMS/1175/III
දිනය: 2016.08.30/ 2019.03.19

1.4 ආයතන අධක්ෂ ජනරාල්ගේ නිර්දේශය: — යොමු අංකය :EST-2/04/REC/10120
දිනය: 2018.10.11

1.5 ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය: — යොමු අංකය : NSCC/01/07/42/SR
දිනය: 2018.08.30

1.6 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය: — යොමු අංකය : PSC/EST/05-01-02/01/2019
දිනය :2019.07.04

02. පත් කිරීම් බලධරයා : රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලය පවරන ලද සුරාබදු කොමසාරිස් ජනරාල්

03. සේවා ගණය පිළිබඳ විස්තර:

3.1 සේවා ගණය : පොලිස් හා නියාමන සේවාවන්

3.2 ශ්‍රේණි : **සුරාබදු නියාමක රියදුරු ,සුරාබදු නියාමක රියදුරු (ත්‍රී රෝද රථ)**

3.3 පැවරෙන කාර්ය භාරය පිළිබඳ පොදු නිර්වචනය : ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ ධාවනය සඳහා යොදවා ඇති සියළු වාහන වල රියදුරු රාජකාරි සහ ත්‍රී රෝද රථ නියාමක රියදුරු සඳහා ත්‍රී රෝද රථ ධාවනයට අදාල රාජකාරි

3.4 කාර්යයන් පැවරීම: ශ්‍රේණිගතව කාර්යයන් පැවරීමක් සිදු නොකරන අතර මෙම සේවා ගණයට පැවරෙන කාර්යයන් අතුරින් ඕනෑම කාර්යයක් සේවයේ අවශ්‍යතාවය මත ජොෂ්ඨතාව හා කුසලතාවය පදනම් කොට ගෙන ඕනෑම නිලධරයකුට දෙපාර්තමේන්තු ප්‍රධාන විසින් පවරනු ලැබිය හැක.

04. තනතුරෙහි / තනතුරුවල ස්වභාවය: ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය.(විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට යටත් විය යුතුය)

05. වැටුප්

5.1 වැටුප් කේතය : RS 01-2016

5:2 මාසික වැටුප් පරිමාණය : රු. 29,540-7x300-27x370-41,630/-

5.3 ශ්‍රේණි ක්‍රමයට අදාල ආරම්භක වැටුප් පියවර:

| **ශ්‍රේණිය** | **ආරම්භක වැටුප් පියවර** | **ආරම්භක වැටුප් තලය** |
|---|---|---|
| **සුරාබදු නියාමක රියදුරු**<br>**සුරාබදු නියාමක රියදුරු (ත්‍රී රෝද රථ)** | **පියවර 1** | **29,540** |

06. සේවා ගණයට අයත් තනතුර / තනතුරු

6.1 අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන්:

| **අනුමත තනතුරු නාම** | **තනතුර අනුමත ශ්‍රේණිය** | **අනුමත තනතුරු සංඛ්‍යාව** | **කාර්යයන්** |
|---|---|---|---|
| **සුරාබදු නියාමක රියදුරු** | **සුරාබදු නියාමක රියදුරු** | **129** | සුරාබදු දෙපාර්තමේන්තුවට අයත් සියලුම වාහන ධාවන රාජකාරි, තමන්ට භාරදී ඇති වාහන වල තෙල් පරීක්ෂාව, ජල පරීක්ෂාව,පිරිසිදු කිරීම,ධාවන සටහන් විධිමත්ව පවත්වාගෙන යාම,වාහනයේ කළ යුතු අළුත්වැඩියාවන් හෝ පවතින දෝෂ සම්බන්ධව අදාල නිලධාරීන්ට දන්වා අළුත්වැඩියා කරවා ගැනීම,වාහනය ගරාජයට භාර දෙන අවස්ථාවන්හිදී සියලුම අංගෝපාංග අදාල ආකෘතිය මඟින් ගරාජය වෙත භාරදීමට සහාය වීම,අළුත්වැඩියාවන් සිදු කරන අවස්ථාවලදී එය අධීක්ෂණය කිරීම, අළුත්වැඩියාවන් නිමවූ පසු පෙර පැවති ගැටලු නිරාකරණය වී ඇති බව සහතික කිරීම, වාහන අනතුරකදී ඒ බව වහාම අදාල නිලධාරීන්ට දැනුම් දීම, අදාල පොලිස් ස්ථානයට පැමිණිලි කිරීම හා රක්ෂණ සමාගම් වලට දැනුම් දීම ආදියට සහාය වීම ආදී රියදුරු රාජකාරි අවශ්‍ය තැන්හි සුරාබදු ක්ෂේත්‍රයට අදාල රාජකාරි වලට සහායවීම |
| **සුරාබදු නියාමක රියදුරු (ත්‍රී රෝද රථ)** | **සුරාබදු නියාමක රියදුරු (ත්‍රී රෝද රථ)** | **01** | |

6.2 ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව : **130**

**සටහන : දරන්නාට පෞද්ගලික වන සේ අනුමත කර ඇති සුරාබදු නියාමක රියදුරු (ත්‍රී රෝද රථ) තනතුර දරන නිලධාරියා විශ්‍රාම යාමෙන් හෝ වෙනත් කරුණු මත එම තනතුර පුරප්පාඩු වූ පසුව එම තනතුර සුරාබදු නියාමක තනතුරට එකතු කරනු ලැබේ.**

**07.** බඳවා ගැනීමේ ක්‍රමය

7.1 බඳවා ගන්නා ප්‍රතිශතයන්

| <u>ධාරාව</u> | <u>ප්‍රතිශතය</u> |
|---|---|
| විවෘත | 100% |
| සීමිත | අදාළ නොවේ |
| කුසලතා | අදාළ නොවේ |

7.2 විවෘත බඳවා ගැනීම

7.2.1 බඳවා ගන්නා ශ්‍රේණිය : සුරාබදු නියාමක රියදුරු

7.2.2 සුදුසුකම්

7.2.2.1 අධ්‍යාපන සුදුසුකම් : අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී එක් වරකදී විෂයන් 05 කට නොඅඩුව සමත්ව, දෙවරකට නොවැඩි වාර ගණනකදි සිංහල/දෙමළ භාෂාව හා වෙනත් විෂයකට සම්මාන සමාර්ථ සහිතව ගණිතය ඇතුළුව විෂයන් 06කින් සමත්වීම .

7.2.2.2 වෘත්තීය සුදුසුකම් :සුරාබදු නියාමක රියදුරු

I. මහා මාර්ග නීති සංග්‍රහය පිළිබඳව මනා දැනුමක් ලබා තිබීම.

II. මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳව මූලික දැනුමක් ලබා තිබීම.

III. මෝටර් බස්රථ, මෝටර් කෝච්, "A" පන්තිය පැදවීම සඳහා මෝටර් ප්‍රවාහන කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද වලංගු බලපත්‍රයක් ලබා තිබීම.

7.2.2.3 පලපුරුද්ද : සුරාබදු නියාමක රියදුරු

අදාල ඛණ්ඩයේ රියදුරු බලපත්‍රයක් ලබා ගැනීමෙන් අනතුරුව වසර 03 ක මෝටර් වාහන රියදුරකු වශයෙන් පිළිගත් ආයතනයක සේවා පලපුරුද්දක් ලබා තිබීම.

7.2.2.4 **කායික සුදුසුකම් :** සුරාබදු නියාමක රියදුරු

I. උස අවම වශයෙන් 5.4 විය යුතුය.

II. ප්‍රාශ්වාසයේදී පපුව අවම වශයෙන් 32 (අඟල්) විය යුතුය.

III. උපැස් යුවලක් හෝ ස්පර්ශ කණ්නාඩි රහිතව භාණ්ඩ හැඳිනීමේ දෘෂ්ටිය ඇතුළුව අවම වශයෙන් 6/6 - හා 6/12 ඇස් පෙනීමකින් යුක්ත විය යුතුය.

Iv. සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා තනතුරේ රාජකාරි ඉටුකිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

7.2.2.5 **වෙනත් :** සුරාබදු නියාමක රියදුරු

i. අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

ii. අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

iii. තනතුරට බඳවා ගැනීමට අදාල සුදුසුකම් සම්පූර්ණ කල යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් වන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ වී තිබිය යුතුය.

7.2.3 වයස :

7.2.3.1 අවම සීමාව : අවු: 22

7.2.3.2 උපරිම සීමාව : අවු: 30

7.2.4 බඳවා ගැනීමේ ක්‍රමය :

7.2.4 සුරාබදු නියාමක රියදුරු

(I). රජයේ ගැසට් පත්‍රයේ දැන්වීමක් පළකිරීම හෝ ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීමක් පළකිරීම සහ වෙබ් අඩවියේ පළකිරීම මගින් ඉල්ලුම්පත් කැඳවා සුදුසුකම්ලත් අයදුම්කරුවන් ලිඛිත පරීක්ෂණයකට භාජනය කෙරේ. (මෙම ලිඛිත පරීක්ෂණය මහාමාර්ග නීති හා මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳව සාමාන්‍ය දැනුම මැන බැලීම සඳහා පවත්වනු ඇත.)

(II). එම ලිඛිත පරීක්ෂණයෙන් ඉහලම ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් අතරින් පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක් වනසේ කායික යෝග්‍යතා පරීක්ෂණයට හා රිය පැදවීමේ ප්‍රායෝගික වෘත්තීය පරීක්ෂණයකට භාජනය කොට,ඉන් සමත් වූ අය ඔවුන් එම පරීක්ෂණයේදි ලබා ගත් ලකුණු හා ලිඛිත පරීක්ෂණයෙන් ලබා ගත් ලකුණු වල කුසලතා අනුපිළිවල අනුව තෝරා ගනු ඇත.

7.2.4.1 ලිඛිත විභාගය :

| විෂයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| I. මහාමාර්ග නීති හා මෝටර් යාන්ත්‍රික විද්‍යාව | 100% | 40% |
| II. පොදු ප්‍රශ්ණ පත්‍රය | 100% | 40% |

(විෂය නිර්දේශය ඇමුණුම - 01 හි දැක්වේ)

7.2.4.1.1 පවත්වන බලධරයා :- පත්කිරීම් බලධරයා හෝ පත්කිරීම් බලධරයා විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින්

7.2.4.2 වෘත්තීය පරීක්ෂණය : රිය පැදවීමේ නිපුනත්වය මැනීමේ ප්‍රායෝගික පරීක්ෂණයකි.

| | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| රිය පැදවීමේ නිපුනතාවය | 40 | 40% |

7.2.4.2.1 පවත්වන බලධරයා : මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ - මෝටර් රථ පරීක්ෂකවරයෙකු, පොලිස් සේවයේ නිලධාරියෙකු හා දෙපාර්තමේන්තුවේ නිළධාරියකුගෙන් සමන්විත මණ්ඩලයක අධීක්ෂණය යටතේ සුරාබදු කොමසාරිස් ජනරාල්ගේ මෙහෙයවීම යටතේ මෙම වෘත්තීය පරීක්ෂණය පවත්වනු ඇත.

7.2.4.3 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය

ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණු:

i. සුරාබදු නියාමක රියදුරු තනතුරට සෑම අතින්ම යෝග්‍ය පුද්ගලයෙකුද යන්න පරීක්ෂා කිරීම.

ii. අවශ්‍ය මූලික සුදුසුකම් තිබේද යන්න පරීක්ෂාකර බැලීම. (සහතික පත් පරීක්ෂාව)

7.2.4.3.1 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත්කරන බලධරයා: සුරාබදු කොමසාරිස් ජනරාල්

7.2.4.4 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය: අදාල නොවේ.

7.2.5. අයඳුම්පත් කැඳවීමේ ක්‍රමය : රජයේ ගැසට් පත්‍රයේ දැන්වීම් පළ කිරීම හෝ ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීම් පළ කිරීම සහ වෙබ් අඩවියේ පළ කිරීම මගින්

08. කාර්යක්ෂමතා කඩඉම්

8.1

| **කුමන කාර්යක්ෂමතා කඩඉමද යන වග** | **කාර්යක්ෂමතා කඩඉම සමත්විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙරද** | **කාර්යක්ෂමතා කඩඉමේ ස්වභාවය ලිඛිත පරීක්ෂණය / වෘත්තීය පරීක්ෂණය / සහතික පාඨමාලා / වෙනත්** |
|---|---|---|
| 1 වන සුරාබදු කාර්යක්ෂමතා කඩඉම | සුරාබදු නියාමක රියදුරු තනතුරට පත්වී වසර 03 ක් ගත වීමට පෙර සමත්විය යුතු බව | වාචික සහ වෘත්තීය පරීක්ෂණය (ඇමුණුම - 02) |
| 2 වන සුරාබදු කාර්යක්ෂමතා කඩඉම | සුරාබදු නියාමක රියදුරු දෙවැනි කාර්යක්ෂමතා කඩඉම පත්වීම ලබා වසර 10 ක් ගතවීමට පෙර සමත්විය යුතු බව | වාචික සහ වෘත්තීය පරීක්ෂණය (ඇමුණුම - 03) |

(විෂය නිර්දේශය ඇමුණුම් - 02 හා 03 හි දැක්වේ)

8.2 කාර්යක්ෂමතා කඩඉම් පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක්ද : වසරකට දෙවරක්

8.3 කාර්යක්ෂමතා කඩඉම්වලට අදාල පරීක්ෂණය පවත්වනු ලබන බලධරයන් කවුරුන්ද :

1 වන කාර්යක්ෂමතා කඩඉම : සුරාබදු කොමසාරිස් ජනරාල් විසින් අනුමත කරනු ලබන පරීක්ෂණ මණ්ඩලයක් විසින්

2 වන කාර්යක්ෂමතා කඩඉම : සුරාබදු කොමසාරිස් ජනරාල් විසින් අනුමත කරනු ලබන පරීක්ෂණ මණ්ඩලයක් විසින්

**09.** භාෂා ප්‍රවීනතාව

9.1

| භාෂාව | ලබා ගත යුතු ප්‍රවීණතාව |
|---|---|
| 01. රාජ්‍ය භාෂාව | රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුනු නිලධාරීන් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීනතාවය පරිවාස කාලය තුලදී ලබා ගත යුතුය. |
| 02. අනෙක් රාජ්‍ය භාෂාව | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 හා ඊට අනුශාංගික චක්‍රලේඛ විධිවිධාන අනුව අදාළ මට්ටමේ ප්‍රවීණතාව ලබා ගත යුතුය. |

**10. ශ්‍රේණි උසස් කිරීම්:** අදාල නොවේ

11. **තනතුරු වලට පත් කිරීම:** **අදාල නොවේ.**

**12. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීතිවල දැක්වෙන පොදු කොන්දේසිවලට පරිබාහිර වන්නා වූ කොන්දේසි** : අදාල නොවේ.

13. **රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන අර්ථ නිරූපන වලට පරිබාහිර වන්නා වූ අර්ථ නිරූපණ:** "සක්‍රීය සේවා කාලය " යනු වැටුප් රහිත නිවාඩු කාලයන් ඇතුලත් නොවන,එහෙත් අමාත්‍ය මණ්ඩලය විසින් ප්‍රතිපත්තියක් ලෙස සක්‍රීය සේවා කාලයක් ලෙස සැලකිය යුතු යැයි විශේෂිතව සඳහන් කරනු ලැබ ඇති වැටුප් රහිත නිවාඩු කාලයන් ද ඇතුළත් නිලධාරියකු ස්වකීය තනතුරට අදාළ වැටුප් ලබමින් සිටි සේවා කාලය වේ.

14.**ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය**: මෙම පරිපාටිය ක්‍රියාත්මක වන දිනට සේවයේ යෙදී සිටින්නන්ට පමණක් අදාල වේ. නියමිත දිනට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 හා ඊට අනුෂාංගික චක්‍රලේඛ මඟින් ලබා දී ඇති PL 3-2016 පරිමාණය යටතේ වැටුප් ලබන නිලධාරීන් සියළුදෙනාම ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 04 වන වගන්තියේ විධිවිධාන වලට යටත්ව පහත සඳහන් පරිදි අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

සේවා කාලය ගණන් ගනු ලබන්නේ ඒ ඒ තනතුරට හෝ ශ්‍රේණියට පත් කරන ලද දිනය පදනම් කරගෙනය. කෙසේ වතුදු අන්තර්ග්‍රහණය හේතුවෙන් අදාල තැනැත්තාගේ වැටුප් වර්ධක දිනයෙහි වෙනසක් සිදු නොවිය යුතු අතර එම දිනය අන්තර්ග්‍රහනයට පෙර පැවති වැටුප් වර්ධක දිනය වශයෙන් නොවෙනස්ව ක්‍රියාත්මක විය යුතුය. එසේම වැටුප් පරිවර්තනයේදී අදාල තැනැත්තා අවසන් වරට ලබමින් සිටි වැටුප් පියවර නව වැටුප් පියවරට අනුරූපී වීම මත ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 4.4 වගන්තිය අනුව ඊලඟ ඉහළ වැටුප් පියවරේ තැබීමද සිදු නොකළ යුතුය

**I.** PL 3-2016 වැටුප් ඛණ්ඩයේ වැටුප් ලබමින් සිටි සුරාබදු නියාමක රියදුරු තනතුර දරණ සියළුම නිලධාරීන් **RS 1-2016 වැටුප් ලබන** සුරාබදු නියාමක රියදුරු **තනතුරට අන්තර්ග්‍රහණය කරනු ලබයි.**

II. PL 3-2016 වැටුප් ඛණ්ඩයේ වැටුප් ලබමින් සිටි ත්‍රී රෝද රථ සුරාබදු නියාමක රියදුරු තනතුර දරණ සියළුම නිලධාරීන් **RS 1 - 2016** වැටුප් ලබන **ත්‍රී රෝද රථ සුරාබදු නියාමක** රියදුරු තනතුරට අන්තර්ග්‍රහණය කරනු ලබයි.

15. සෑම පත්වීමක් සම්බන්ධයෙන්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක : 1589/30 හා 2009.02.20 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත කාර්ය පරිපාටික රීති වල දැක්වෙන කොන්දේසි හා ආයතන සංග්‍රහයේ විධිවිධාන අදාල වේ.

16. මෙම බඳවා ගැනීම් පරිපාටි විධිවිධාන සලසා නොමැති යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

17. අන්තර් කාලීන විධි විධාන : අදාල නොවේ.

සකස් කලේ : අත්සන :..........................
(විෂය භාර කණිෂ්ඨ මාණ්ඩලික නිලධාරියා)

නම : ඒ.එච්.එම්.එස්.පී.අබේසිංහ

තනතුර : පරිපාලන නිලධාරි

දිනය : 2019.07. 10 .

පරීක්ෂා කලේ : අත්සන ..........................
(විෂය භාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරියා)

නම : එස්.ටී.ජයවර්ධන

තනතුර : නියෝජ්‍ය සුරාබදු කොමසාරිස් (පාලන)

දිනය : 2019.07.10

සමීර ජයවර්ධන
නියෝජ්‍ය සුරාබදු කොමසාරිස් (පාලන)
ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව
අංක. 353, කෝට්ටේ පාර,
රාජගිරිය.

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන :..................................

(දෙපාර්තමේන්තු ප්‍රධාන)

නම : එච්.ජී. සුමනසිංහ

එච්.ජී. සුමනසිංහ
සුරාබදු කොමසාරිස් ජනරාල්

තනතුර : සුරාබදු කොමසාරිස් ජනරාල් (රා.ආ.)

දිනය : 2019.07.11

නිළමුද්‍රාව :..................................

යොමු අංකය : MF1/02/20/EXC/3

2019.07.04 දිනැතිව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ නියාමන සේවා ගණයේ සුරාබදු නියාමක රියදුරු තනතුර සඳහා වන මෙම බඳවා ගැනීමේ පරිපාටිය සහතික කිරීම සඳහා නිර්දේශ කරමි.

අත්සන :..................................

නම : ..........................

ලේකම්

මුදල් අමාත්‍යාංශය

දිනය : 2019.07. 25

ඒ. කේ. සෙනෙවිරත්න
භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්,
මුදල් අමාත්‍යාංශය
මහලේකම් කාර්යාලය
කොළඹ 01.

නිළමුද්‍රාව :..................................

යොමු අංකය : PSC/EST/05-01-02/01/2019

ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ නියාමන සේවා ගණයේ සුරාබදු නියාමක රියදුරු තනතුර සඳහා වන මෙම බඳවා ගැනීමේ පරිපාටිය 2017.07.04 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදි.

අත්සන : ..............................

නම : එම්. ඒ. බී. දයා සෙනරත්

ලේකම්

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

එම්. ඒ. බී. දයා සෙනරත්
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
නො. 1200/9, රජමල්වත්ත පාර
බත්තරමුල්ල.

2019.08.0

**<u>ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ සුරාබදු නියාමක රියදුරු තනතුරට බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය</u>**

**<u>විෂය නිර්දේශය</u>**

1. විභාගයේ නම : ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ සුරාබදු නියාමක රියදුරු තනතුරට බඳවා ගැනීමේ පරීක්ෂණය
2. විභාගය පිළිබඳ විස්තර :

| ප්‍රශ්ණ පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| I. මහාමාර්ග හා නීති හා මෝටර් යාන්ත්‍රික විද්‍යාව | පැ.03 | 100 | 40% |
| II. පොදු ප්‍රශ්ණ පත්‍රය | පැ.01 මි.30 | 100 | 40% |

3. විභාගය පවත්වනු ලබන බලධරයා : සුරාබදු කොමසාරිස් ජනරාල්
4. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග : අදාල පරිදි වසරකට වරක්
5. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්ණ පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| I. මහාමාර්ග හා නීති හා මෝටර් යාන්ත්‍රික විද්‍යාව | මහා මාර්ග නීති පිළිබඳව දැනුම හා කාර්මික ක්ෂේත්‍රයන් පිළිබඳව දැනුම හා එම ක්ෂේත්‍රයන්ට අදාල දෝෂයන් පිළිබඳව මූලික අවබෝධය මැන බැලීම සඳහා වන ප්‍රශ්ණ පත්‍රයකි. |
| II. පොදු ප්‍රශ්ණ පත්‍රය | අයදුම්කරුගේ සාමාන්‍ය දැනුම මැන බැලීම සඳහා සකස්වන පොදු ප්‍රශ්න පත්‍රයකි |

සකස් කලේ : අත්සන :..............................

(විෂය භාර කණිෂ්ඨ මාණ්ඩලික නිලධාරියා)

නම : ඒ.එච්.එම්.එස්.පී.අබේසිංහ

තනතුර : පරිපාලන නිලධාරි (පාලන)

දිනය : 2019.07. 10 .

පරීක්ෂා කලේ : අත්සන ..............................

(විෂය භාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරියා)

නම : එස්.ටී.ජයවර්ධන

තනතුර : නියෝජ්‍ය සුරාබදු කොමසාරිස්

සමීර ජයවර්ධන
නියෝජ්‍ය සුරාබදු කොමසාරිස් (පාලන)
ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව
නො. 353, කෝට්ටේ පාර,

දිනය : 2019.07.10

අත්සන :..............................

(දෙපාර්තමේන්තු ප්‍රධානි)

එච්.ජී. සුමනසිංහ
සුරාබදු කොමසාරිස් ජනරාල්

නම : එච්.ජී. සුමනසිංහ

තනතුර : සුරාබදු කොමසාරිස් ජනරාල් (රා.ආ.)

දිනය : 2019.07.11

නිළමුද්‍රාව :..............................

ඇමුණුම -02

**ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ සුරාබදු නියාමක රියදුරු තනතුරට අදාල පළවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය**

1. වෘත්තීය පරීක්ෂණයේ නම : ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ සුරාබදු නියාමක රියදුරු තනතුරට අදාල කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය
2. වෘත්තීය පරීක්ෂණය පිළිබඳ විස්තර :

| විෂය ක්ෂේත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| I. මහාමාර්ග නීති හා මෝටර් යාන්ත්‍රික විද්‍යාව | අදාල පරිදි | 100 | 40% |

3. පවත්වනු ලබන බලධරයා : සුරාබදු කොමසාරිස් ජනරාල්
4. පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග : වසරකට දෙවරක්
5. වෘත්තීය පරීක්ෂණය සඳහා වන විෂය නිර්දේශය :

| විෂය ක්ෂේත්‍රය | විෂය නිර්දේශය |
|---|---|
| I. මහාමාර්ග නීති හා මෝටර් යාන්ත්‍රික විද්‍යාව | මහාමාර්ග නීති සංග්‍රහය සහ මෝටර් රථ යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනීම මැන බැලීමේ වාචික හා වෘත්තීය පරීක්ෂණයකි. |

සකස් කලේ : අත්සන :..............................
(විෂය භාර කණිෂ්ඨ මාණ්ඩලික නිලධාරියා)

නම : ඒ.එච්.එම්.එස්.පී.අබේසිංහ
තනතුර : පරිපාලන නිලධාරි
දිනය : 2019.07.10 .

පරීක්ෂා කලේ : අත්සන ..............................
(විෂය භාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරියා)

එස්.ටී. ජයවර්ධන
නියෝජ්‍ය සුරාබදු කොමසාරිස් (පාලන)
ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව
නො. 353, කෝට්ටේ පාර,
රාජගිරිය.

නම : එස්.ටී.ජයවර්ධන
තනතුර : නියෝජ්‍ය සුරාබදු කොමසාරිස් (පාලන)
දිනය : 2019.07.10

අත්සන :..............................
(දෙපාර්තමේන්තු ප්‍රධානී)

එච්.ජී. සුමනසිංහ
සුරාබදු කොමසාරිස් ජනරාල්

නම : එච්.ජී. සුමනසිංහ
තනතුර : සුරාබදු කොමසාරිස් ජනරාල් (රා.ආ.)

දිනය: 2019.07. 11 .

නිල මුද්‍රාව : ..............................

**ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ සුරාබදු නියාමක රියදුරු තනතුරට අදාල දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය**

1. වෘත්තීය පරීක්ෂණයේ නම : ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ සුරාබදු නියාමක රියදුරු තනතුරට අදාල දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය
2. වෘත්තීය පරීක්ෂණය පිළිබඳ විස්තර :

| විෂය ක්ෂේත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| I. මහා මාර්ග නීතිය හා මෝටර් රථ යාන්ත්‍රික විද්‍යාව | අදාල පරිදි | 100 | 40% |

3. පවත්වනු ලබන බලධරයා : සුරාබදු කොමසාරිස් ජනරාල්
4. පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග : වසරකට දෙවරක්
5. වෘත්තීය පරීක්ෂණය සඳහා වන විෂය නිර්දේශය :

| විෂය ක්ෂේත්‍රය | විෂය නිර්දේශය |
|---|---|
| I. මහා මාර්ග නීතිය හා මෝටර් රථ යාන්ත්‍රික විද්‍යාව | මහාමාර්ග නීති සංග්‍රහය සහ මෝටර් රථ යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ ( ඉහළ මට්ටමේ ) දැනීම මැන බැලීමේ වාචික හා වෘත්තීය පරීක්ෂණයකි. |

සකස් කලේ : අත්සන :............................
(විෂය භාර කණිෂ්ඨ මාණ්ඩලික නිලධාරියා)
නම : ඒ.එච්.එම්.එස්.පී.අබේසිංහ
තනතුර : පරිපාලන නිලධාරි
දිනය : 2019.07. 10

පරීක්ෂා කලේ : අත්සන ...............................
(විෂය භාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරියා)
නම : එස්.ටී.ජයවර්ධන
තනතුර :නියෝජ්‍ය සුරාබදු කොමසාරිස් (පාලන)
දිනය : 2019.07.10

අත්සන : ...................................................
(දෙපාර්තමේන්තු ප්‍රධාන)
නම : එච්.ජී. සුමනසිංහ
තනතුර : සුරාබදු කොමසාරිස් ජනරාල් (රා.ආ.)

දිනය: 2019.07.11

නිළ මුද්‍රාව : ....................................